---

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජූලි 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු වටිනාකම රු.4,832,276 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දායක බිල් වටිනාකම වූ රු.232,560 ක් ගිණුම් වලට ගලපා නොතිබුණි

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 09 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.54,795,100 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.64,285,155 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම්වල බැර ශේෂ එකතුව රු.3,977 ක් විය.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
--------------------

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව ගිණුම් ශේෂවල වටිනාකම රු.6,592,119 ක් විය.

1.3.5 අනුකූල නොවීම්
------------------

පළාත් පාලන කොමසාරිස් (වයඹ) ගේ 1999 අගෝස්තු 25 උනැති අංක 99/01 දරන චක්‍රලේඛය පරිදි සභාවේ වාහන සඳහා මාසිකව දැරිය හැකි ඉන්ධන සීමාවන් නියමකරගෙන නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.40,610,717 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.26,218,797 ක් විය.

2.2 මූල්‍ය පාලනය
-----------------

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් ණයගැති යටතේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම ලෙස පැවති රු.142,560 ක ශේෂය හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුමකට අදාලව නිකුත් කල නමුත් ගෙවීම සඳහා මාස 6 කට වැඩි කාලයක් ඉදිරිපත් නොවූ රු. 108,940 ක් වටිනා චෙක්පත් 34 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 396 විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුමකට අදාලව තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ රු. 2,044 වටිනා චෙක්පත් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් 03 කට අදාලව පැවති අගරු චෙක්පත් රු.551,121 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 189 හා 486 විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 3,581 | 302 | 417 | 367 | 311 | 512 |
| (ii) | බදුකුලී | 5,685 | 3,650 | 26 | 6,134 | 3,340 | 265 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 711 | 733 | 70 | 741 | 661 | 108 |
| (iv) | වෙනත් ආදායම් | 39,935 | 78,181 | - | 54,191 | 55,678 | - |
| | එකතුව | 49,912 | 82,866 | 513 | 61,433 | 59,990 | 885 |

2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකල රු.27,263,036 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.36,886,760 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3.4 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලයේ හා හොරොම්බාව උප කාර්යාලයේ වරිපනම් බදු හිඟය රු.155,019 ක් ව පැවතියද, 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 33 රීතිය අනුව ගෙවීම් පැහැර හරින පුද්ගලයන්ගේ ලැයිස්තු, දෙපල තහනම් කිරීමේ වරෙන්තු ලේඛණ එක් එක් කාර්තුව අවසානයේ වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර සභාපතිවරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කළයුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. එමෙන්ම හිඟ බදු සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 161(1) අනුව අධිගාස්තු අයකිරීම සම්බන්ධයෙන් අදාල විධිවිධාන ගැසට් නිවේදනයේ පළකර නොතිබුණි.

2.3.5 සභාව සතු වත්කම් බදුදීම

සභාව සතු අවම ලංසුව රු.388,846 ක් වූ මස්කඩ 06 ක්, මාළු ලැලි 08 ක් හා බදු දේපල 23 ක් සඳහා බදුකරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව බදුදීමට නොහැකි වී තිබුණි එමෙන්ම මේ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ 2001 ජනවාරි 03 දිනැති අංක 1/අව/පොදු/2001 දරන චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමක් ද සිදුව නොතිබුණි.

2.3.6 බස්නැවතුම්පල කඩ කාමර බදුදීම

කටුපොත බස් නැවතුම්පල කඩ කාමර 12 ක් අවම ලංසුව වූ රු.60,000 ක මුදලකට දිගින් උගටම ටෙන්ඩර් කල නමුත් ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් බදුදීමට නොහැකි වී තිබුණි.

2.3.7 අක්කර බදු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු.262,002 වූ අතර, අක්කර බදු ලේඛණය අනුව බදු අයවන දේපල ගණන වූ 204 න් 105 ක් ම වසර 1ට වඩා වැඩි හිඟයක් පැවතුණි. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 33 සිට 41 දක්වා ඇති රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4 වියදම් ව්‍යුහය

---------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 23,897 | 25,467 | (1,570) | 24,162 | 23,936 | 226 |
| අනෙකුත් | 14,781 | 16,790 | (2,009) | 15,131 | 9,838 | 5,293 |
| උප එකතුව | 38,678 | 42,257 | (3,579) | 39,293 | 33,774 | 5,519 |
| ප්‍රාග්ධන වියදම | 13,527 | 89,495 | (75,968) | 29,051 | 37,050 | (7,999) |
| මුළු එකතුව | 52,205 | 131,752 | (79,547) | 68,344 | 70,824 | (2,480) |

2.5 මානව සම්පත් කළමණාකරණය

----------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|

| | | |
|---|---|---|
| විධායක | 02 | 02 |
| ද්විතීයික | 52 | 47 |
| ප්‍රාථමික | 40 | 37 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 03 |

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

2010 පෙබරවාරි 05 දින රු.130,862 ක් වැයකර මිලට ගෙන තිබූ කොන්ක්‍රීට් කුට්ටි නිෂ්පාදන යන්ත්‍රය කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය සඳහා ප්‍රතපාදන නොලැබීම, නිෂ්පාදන අංගනය සකස් නොකිරීම වැනි හේතු නිසා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එයින් කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනයක් සිදුව නොතිබුණි.

2.6.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,425,973 ක් ව අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොවුනි.

2.6.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවීම හිඟහිට තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.141,761 ක් වූ අතර එය වර්ෂ 3කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයක් විය.

2.7 හඳුනාගත් පාඩු හා හානි

එකතු කල අගය මත බදු හා මුද්දර ගාස්තු ලෙස සභාව විසින් 2008 මැයි සිට 2009 ජූලි දක්වා බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම නිසා ප්‍රමාද ගාස්තු ලෙස රු.553,551 සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි.

2.8 <u>මතභේදයට තුඩුදෙන ගණුදෙනු</u>

සභා බල ප්‍රදේශයට අයත් කිතලව දියුණුගම් ප්‍රදේශයක් ලෙස 1996 නොවැම්බර් 22 දින ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කර ඇතත්, ඒ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් වරයාගෙන් හා විෂය භාර අමාත්‍යවරයාගෙන් ලබාගත යුතු අනුමැතීන් ලබා නොගැනීම හේතුවෙන් එකී ප්‍රදේශයට අදාලව 2006 දෙසැම්බර් 31 දක්වා බිල්කර පැවති රු.48,865 ක වරිපනම් බදු මුදලක් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුල කපාහැරීමට සිදුවී තිබුණි.

2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 984,436 ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 19,364 බැගින් එකී අරමුදල විසින් අය කර පැවතියද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් වී නොතිබුණි.

2.10 පොත්පත් ලේඛණ පවත්වාගෙන යාම

(අ). 2010 නොවැම්බර් මාසයෙන් පසු අවස්ථා 04 කදී මිලදී ගත් රු.47,855 ක් වටිනා ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය භාණ්ඩ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම තොග ලේඛණවල ඇතුළත් කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුල වීථි පහන් අළුත්වැඩියාව සඳහා රු.1,248,240 ක් වැයකර තිබුණද සභාව සතු විදුලි පහන් පවතින ස්ථාන හඳුනාගත හැකිවන පරිදි විධිමත් ලේඛණයක් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී ද පවත්වා නොතිබුණි.

(ඇ). චෙක්පත් ලේඛණය, වැය ලේඛණය, වරිපනම් හා අක්කර බදු ලේඛණය, ණයගැති හා ණයහිමි ලේඛණ සමාලෝචිත වර්ෂයට අදාලව නිසි පරිදි පවත්වා නොතිබූ අතර, 2009 වර්ෂයට පෙර ලබාදී තිබූ අත්තිකාරම් පියවීම් අත්තිකාරම් ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.

2.11 කාර්ය සාධනය

(අ). උසාවි දඩ හා මුද්දර ගාස්තු අරමුදල් ප්‍රභවය ලෙස සාදාගෙන ඇස්තමේන්තු ගත පිරිවැය රු.1,800,000 ක් වූ කර්මාන්ත 5 ක් විවිධ හේතු දක්වමින් ඉටුකර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛණය මගින් ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.975,000 ක් වූ සුභසාධන කාර්යයන් 7 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

2.12 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය